# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1838/26 - 2013 නොවැම්බර් මස 27 වැනි බදාදා - 2013.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

### පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ පොල් වැවීමේ කර්මාන්තය විසින් ඇති කරන ලදුව මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති තීරණ, ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥා පනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 දෙසැම්බර් මස 01 දින සිට වලංගු විය යුතුය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ 05,
කම්කරු මහ ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

පොල් වැවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1949 අප්‍රේල් මස 30 වැනි දින අංක 9971 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද, වරින් වර වෙනස් කරන ලද්දා වූද, අවසන් වරට අංක 1748/14 සහ 2012 මාර්තු මස 09 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් වෙනස් කරනු ලැබූවාවූද තීරණ පහත සඳහන් අයුරු තව දුරටත් වෙනස් කළ යුතුය.


1 A – PG 1851 — 750 (2013/11)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය (සම්බන්ධිතයි)*

(1) එම උපලේඛනයේ II වන කොටසෙ කැලි මිම්මේ සේවකයින්ට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන් මෙයේය.

| *කාර්යය* | | *පඩි ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|---|
| (1) වැවිල්ල දැමීම හා නඩත්තු කිරීම, පොල් කැඩීම | - | ගස් 1000ක් සඳහා රු. 1,655.00 |
| (2) කොප්පරා තැනීම, පොල් ලෙලි ගැසීම, පොල් බිඳීම, කොප්පරා වේලීම සහ තේරීම | - | ගෙඩි 1000ක් සඳහා රු. 485.00 |

*III වන කොටස*

(2) කාර්යයන් :

(අ) පොල් වැවිල්ලක් වගා කිරීම හා පවත්වාගෙන යෑම ;

(ආ) කොප්පරා සෑදීම.

ඉහත සඳහක් කාර්යයන් සම්බන්ධයෙන් කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණයන් වන්නේ

සියළුම කම්කරුවන් සඳහා දිනකට - රු. 415.00

ගවපාලනයේ නිරත යම් සේවකයෙකුට වැඩ වේලා සඳහා ඉරිදාට ගෙවිය යුතු පඩි ප්‍රමාණය විය යුත්තේ, මෙම කොටසේ කලින් දී ඇති විධිවිධානවලට ඇතුළත් කිසියම් ප්‍රතිවිරෝධී කරුණකින් ප්‍රතිශෝධනය නොවූ වැඩ කරන සාමාන්‍ය දවසකට එබඳු සේවකයෙකුට ගෙවිය යුතු පඩි ප්‍රමාණය මෙන් එකහමාර ගුණයකි.

*III "ඒ" වන කොටස*

(අ) කොන්දොස්තර කෙනෙකුගේ වැඩවලට

(ආ) මුරකරුවෙකුගේ වැඩ වලට

අදාල කාල මිම්මේ අවම වැටුප් ප්‍රමාණය වන්නේ :

| *අක්කර ප්‍රමාණය* | | *මුරකරු*<br>*රු.* | *කොන්දොස්තර*<br>*රු.* |
|---|---|---|---|
| (1) අක්කර 10ට නොඅඩු එහෙත් අක්කර 25ට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | 9,520.00 | අදාල නැත |
| (2) අක්කර 25ට නොඅඩු එහෙත් අක්කර 50කට අඩු පොල් වැවිල්ලක් හෝ කොටසක නම් | - | 9,935.00 | 10,210.00 |
| (3) අක්කර 50ට වැඩි පොල් වැවිල්ලක් හෝ කොටසක් නම් | - | 11,385.00 | 11,660.00 |

12 - 482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.